# ඩා වින්චි කෝඩ් තහනම

අකෂරය ගැන ලිවීමට පෙර ඩා වින්චි කෝඩ් ගැන ලිවීමට පෙළඹීමට හේතු කිහිපයක් ඇත. මෙරට මහා ප්‍රබුද්ධයන් යැයි තමන් විසින් කියාගනු ලබන පුද්ගලයන්ගේ හැසිරීම පිළිබඳව ඩා වින්චි කෝඩ් තහනමින් යමක් ඉගෙන ගැනීමට ඇත. අකෂරය තහනම් කෙරුණේ රැඟුම් පාලක මණ්ඩලයේ සාමාජිකයන් ඒ නැරඹීමෙන් පසුව එයට වැඩිහිටි ප්‍රදර්ශන සහතිකය ලැබී ප්‍රංශ තානාපති කාර්යාලයේ සෘජු හෝ වක්‍ර හෝ සහභාගීත්වයකින් කෙරුණු සීමිත වුවත් මහජන ප්‍රදර්ශනයකටත් සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමැති, අදාළ අමාත්‍යංශ ලේකම්, මහෙස්ත්‍රාත්වරියක (ඒ චිත්‍රපටයෙන් සිංහල සංස්කෘතියට පහර ගැසීමට අමතරව පොදුවේ අධිකරණයට හා විශේෂයෙන් මහෙස්ත්‍රාත්වරියනට පහර ගැසෙන්නේ යැයි කියැවෙයි) චිත්‍රපට සංස්ථාවේ සභාපති ඇතුළු පිරිසක් සඳහා කෙරුණු ප්‍රදර්ශනයකටත් පසුව ය. (මේ ප්‍රදර්ශනවල නීත්‍යනුකූල බව හෝ නැති බව හෝ අධිකරණය විසින් විසඳෙනු ඇත) එහෙත් මට වැටහෙන අයුරින් ඩා වින්චි කෝඩ් තහනම් කෙරී ඇත්තේ රැඟුම් පාලක මණ්ඩලය තබා ඒ තහනම කළ ජනාධිපති මහින්ද රාජපකෂ මහතාවත් චිත්‍රපටය නැරඹීමෙන් පසුව නොවෙයි. අඩුම තරමින් චිත්‍රපටයට විරුද්ධව පැමිණිලි කළ මෙරට කතෝලික බිෂොප්වරුන්ගෙන් කිහිපදෙනකු හෝ ඒ චිත්‍රපටය නරඹා ඇත්දැයි මම නොදනිමි. සංස්කෘතික ඇමැතිවරයාට විරුද්ධව (වාචික) අවි අතට ගෙන ඇති රැඟුම් පාලක මණ්ඩලයේ සිටින ඇතැම් වීරයන් තමන්ට ද නොපෙන්වා චිත්‍රපටයක් තහනම් කිරීම ගැන ජනාධිපතිවරයාට විරුද්ධව කිසිවක් නොකියන්නේ ඇයි?

අකෂරය තහනමට විරුද්ධව කතා කළ සම්භාව්‍ය චිත්‍රපට අධ්‍යකෂවරුන් යැයි කියන්නන් එක්කෝ ඩා වින්චි කෝඩ් සම්බන්ධයෙන් නිහඬය. නැත්නම් තහනම යුක්ති යුක්ත කිරීමේ බර කරට ගෙන ඇත. මේ සම්බන්ධයෙන් නිහඬ අධ්‍යකෂවරුන් අතර පෙරටුගාමියකු කතෝලික බවත්, ඔහු අකෂරය තහනමට විරුද්ධව සිංහ ගර්ජනා කළ බවත් අපි දනිමු. එසේම ඔහු ළඟදී රුසියන් චිත්‍රපටයක් අමු අමුවේම පිටපත් කර ජාත්‍යන්තර සම්මානයට ලක් වූ බවත් අපි දනිමු. තහනම යුක්ති යුක්ත කරන සම්භාව්‍ය අධ්‍යකෂවරයකු හඟවන්නේ එයට පාදක වූ පොත අසාර්ථක බවත් ඒ නිසා චිත්‍රපටය ද අසාර්ථක විය යුතු බවත් ය.

මෙරට බොහෝ චිත්‍රපට අධ්‍යකෂවරු සාර්ථක නවකතාවලින් පවා අසාර්ථක චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ ශූරයන් වන බැවින් ඔහු චිත්‍රපට නොබලා ම එවැනි නිගමනයකට එළඹියේ දැයි නො දනිමු. අසාර්ථක පොත් පාදක කරමින් ද සාර්ථක චිත්‍රපට නිපදවිය හැකි බව ඔහු නොදන්නා සේය. අනෙක් අතට චිත්‍රපටයක් තහනම් කිරීමට සාර්ථක අසාර්ථකභාවය නිර්ණායකයක් කරගත යුතු යැයි කියා ඇත්තේ කෙසේද?

ඩා වින්චි කෝඩ් චිත්‍රපටය තහනම් කිරීමට පකෂව කතා කරන්නන් ගෙනහැර දක්වන කරුණු අතරින් අපට සාකච්ඡා කිරීමට ඇත්තේ එමගින් යම් ජන කොට්ඨාසයකගේ සිත් පෑරෙන්නේය යන්න පමණකි. චිත්‍රපටයෙන් මෙරට කතෝලික ජනයාගේ සිත් පෑරෙන්නේය යන පදනමින් ඒ තහනම් කිරීමට යමකු එකඟ වී යැයි සිතමු. එවිට ප්‍රශ්නය වන්නේ ඒ නිර්ණායකය මත පදනම් ව වෙනත් චිත්‍රපට සම්බන්ධයෙන් ද එවැනි තීරණ ගත් අවස්ථාවේද යන්නය. දෙමළ ජාතිවාදයට හා ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරන හමුදා භටයන්ගේත්, බොහෝ සිංහලයන්ගේත් සිත් පෑරෙන අන්දමට නිපදවා ඇති චිත්‍රපට සංඛ්‍යාව එකක් පමණක් නොවේ. මෙරට සිංහල සංස්කෘතියට පහර පිට පහර දෙමින් නිපදවන චිත්‍රපටිවලින් බොහෝ සිංහලයන් විශේෂයෙන් ම බොහෝ සිංහල බෞද්ධයන් පස්වණක් ප්‍රීතියෙන් පිනා යන්නේ යැයි ප්‍රබුද්ධයන් සිතන්නේද? මේ තහනම් කිරීම්වලින් හා තහනම් නොකිරීම්වලින් අපට පෙනී යන වැදගත් කරුණක් වෙයි. එනම් මෙරට සිංහල බෞද්ධකම ඡන්දය ගැනීමට පමණක් යොදා ගන්නා දෙයක් බවත්, මෙරට ඇතැම් කරුණු සම්බන්ධයෙන් ඇත්තේ කතෝලික සංස්කෘතික ආධිපත්‍යයක් බවත් ය.

බටහිර නූතනත්වයේ (කතෝලික නොවන) ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට බොහෝ රටවල මෙන් නොව මෙරට තවමත් සමස්ත ආධිපත්‍යය ලබා ගැනීමට නොහැකි වී ඇත. මෙරට සිංහල බෞද්ධ සංස්කෘතික ආධිපත්‍යයක් ඇතැයි ඊනියා ප්‍රබුද්ධයන් බෙරිහන් දුන්නද රාජ්‍ය තන්ත්‍රයේ එවැන්නක සේයාවක්වත් නැත. බුදු පිළිම වහන්සේ නමක් කාර්යාලයක තැන්පත් කිරීමක් වාර්ෂික පිරිත් පිංකමක් සංවිධානය කිරීමක් වැනි සංකේතාත්මක ක්‍රියාවලින් සිංහල

© Prof. Nalin De Silva

බෞද්ධයන් මුළාකිරීමට හැකි බව දන්නෝ දනිති. සංකේත අනවශ්‍ය යැයි මම නොකියමි. එහෙත් අවාසනාවකට දහනව වැනි සියවසේ අග භාගයේ සිට සිංහල බෞද්ධයන් පුරුදු වී ඇත්තේ සංකේත හඹා යෑමට පමණය. ඒ ඕල්කට් බෞද්ධයන් ගුණානන්ද හිමි, ධර්මපාල බෞද්ධයන් පැරදවීමේ ප්‍රතිඵලයකි. ඒ පැරදවීම පිටුපස ඇත්තේ බටහිර ක්‍රිස්තියානු නූතනත්වයය.

ඩා වින්චි කෝඩ් (සැඟවුණු සංකේත) යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි තවත් පියවරක් පමණය. ලෙනාඩෝ ඩා වින්චි යනු පහළොස්වැනි සියවසේ ඉතාලියේ විසූ බුද්ධිමතෙකි. ඔහු කතෝලික සංස්කෘතියෙන් ක්‍රිස්තියානි සංස්කෘතිය කැඩී වෙන්වීමේ ආරම්භක පියවර නියෝජනය කළේය. විෂය ගණනාවක නිපුනත්වයක් දැක්වූ ඔහු විශිෂ්ට චිත්‍ර ශිල්පියෙක් ද විය. ඔහු විසින් අඳින ලද චිත්‍රවල, විශේෂයෙන් ම අවසන් රාත්‍රි භෝජනය යන චිත්‍රයේ ඇති සැඟවුණු සංකේතවලින් දක්වන්නේ කුමක්ද යන්න ගැන කෙරෙන විවරණයක් මත  ඩා වින්චි කෝඩ් පොත පදනම් වෙයි. මේ විවරණය ඉතා දීර්ඝ වූවකි. ඒ විස්තර කිරීම මෙහිදී අනවශ්‍යය. ඉන් කියැවෙන වැදගත් කරුණු නම් ක්‍රිස්තුස් වහන්සේ විවාහකයකු බවත්, එතුමන්ගේ භාර්යාව මාරි මග්දලේනා බවත්, අන්තිම රාත්‍රි භෝජනය චිත්‍රයෙහි ක්‍රිස්තුස් වහන්සේගේ දකුණු පසින් ඇඳ ඇත්තේ ඇය බවත්, ක්‍රිස්තුස් වහන්සේ වඩාත්ම ආදරය කළ අපොස්තුළුවර ජෝන් යනු සැඟවුණු සංකේතයක් බවත් ඉන් කියැවෙන්නේ මාරි මග්දලේනා බවත්, ඒ චිත්‍රයෙහි හෝලි ග්‍රේල් යනුවෙන් හැඳින්වෙන ක්‍රිස්තුස් වහන්සේගේ ලේ සහිත කුසලාන අන් කිසිවක් හෝ අන් කිසිවකු හෝ නොව එතුමන්ගේ රුධිරයෙන් ඇතිවුණු එතුමන්ගේ දරුවා කුසෙහි දරා සිටි මාරි මග්දලේනා බවත්, මාරි මග්දලේනා අභිසාරිකාවක යන මතය ඇගේ නියම තත්ත්වය වසන් කිරීමට කතෝලික පල්ලිය ගෙතූ බොරුවක් බවත්, ක්‍රිස්තුස් වහන්සේට කුරුසයෙහි ඇණ ගසන අවස්ථාවෙහි ගැබ් ගෙන සිටි මාරි මග්දලේනා එතුමන්ගේ ස්වර්ගප්‍රාප්තියෙන් පසු ප්‍රංශයට පලාගිය බවත්, එහිදී සරා නම් දියණියක බිහිකළ බවත්, සියොන්හි පූජකාගාරය ඒ පරම්පරාව පිළිබඳ තොරතුරු රැකගෙන ඇති බවත්, ඩාවින්චි විද්වතා ඒ පූජකාගාරයෙහි සාමාජිකයකු ලෙස ඒ රහස් දැන සිටි බවත්ය.

පසු කලෙක ජීවත් වූ අයිසැක් නිව්ටන් විද්වතා පවා මේ පූජකාගාරයෙහි නායකයකු බව ද කියැවෙයි. මේ පිළිබඳ හදාරා නොමැති මට මෙහි සත්‍යාසත්‍යභාවය පිළිබඳ කිසිවක් කිව නොහැකිය. එහෙත් දෙමළ කතෝලික එස්. ජේ. එමානුවෙල් පූජක තැන වරක් ප්‍රභාකරන් ක්‍රිස්තුස් වහන්සේට සංසන්දනය කර තිබුණේ මේ විවාහ කතාව ද සැලකිල්ලට ගෙනදැයි නොදනිමි.

කෙසේ වෙතත් මෙහිදී අපට වැදගත් වන්නේ බටහිර ක්‍රිස්තියානු නූතනත්වයේ උත්පත්තිය ය.

ඩා වින්චි විද්වතා මේ නූතනත්වය ආරම්භයේදී ම ජීවත් විය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පුරෝගාමීන් වූ ඩා වින්චි විද්වතා මෙන් ම කොපර්නිකස් ආදී පඬිවරු ද කතෝලික වූහ. ඔවුන් කතෝලික නොවන ක්‍රිස්තියානියකට මග පෑදුවේ අවිඥානිකව යැයි සිතිය හැකිය. ඔවුන් ඇරඹූ චින්තන විප්ලවය මධ්‍යකාලීන කලෝතික චින්තනයෙන් කැඩී නූතනත්ව ක්‍රිස්තියානි චින්තනය බිහි කළේය. ක්‍රිස්තියානි චින්තනයේ සම්ප්‍රාප්තිය 1517 දී මාටින් ලූතර් විසින් නිල වශයෙන් ප්‍රකාශ කරන ලදී. ඒ ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානිය බිහි කිරීමෙනි. එහෙත් එයට පෙර ද බටහිර නූතනත්ව ක්‍රිස්තියානි චින්තනයේ බිජුවට ඩා වින්චි, මිචලාංජිලෝ ආදී බුද්ධිමතුන් වපුරා තිබිණි. ක්‍රිස්තියානි සංස්කෘතිය කතෝලික සංස්කෘතිය මෙන් නොව, වෙනත් දෑ අතර පුද්ගලිකත්වයට, වෙන්කිරීමට, ඉන්ද්‍රියන් පිනවීමට, වියුක්තියට තැන දෙයි. එහි ක්‍රිස්තුස් වහන්සේගේ මෑණියන් වූ මරියතුමියට (ක්‍රිස්තුස් වහන්සේ කන්‍යාවකගෙන් බිහිවීමට) වැදගත්කමක් නොලැබෙයි. ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වය වෙනුවට දෙවියන් වහන්සේගේ දේවත්වයට තැනදීම හා සමූහයෙන් වෙන් වී පෞද්ගලිකව, ඍජුව දෙවියන් වහන්සේ ඇදහිය හැකි බව පිළිගැනීම ආදිය ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පදනමෙහි වෙයි. ක්‍රිස්තියානි ආගමෙහි අවසන් අරමුණ ලෙස මා දකින්නේ මරියතුමිය පමණක් නොව කතෝලිකයන්ගේ ක්‍රිස්තුස්වහන්සේ ද නොමැති ක්‍රිස්තියානියක් බිහිකිරීමය. එරික් ෆ්‍රොම් විද්වතා බටහිර ක්‍රිස්තියානිය ගැන නාහෙන් අඬන්නේ මේ කරුණු වටහා ගැනීමට නොහැකිවීමෙනි.

පහළොස්වැනි සියවසේ සිට කතෝලික නොවන ක්‍රිස්තියානි චින්තනය කතෝලික චින්තනය අභිබවා යෑමට පියවර ගෙන ඇත. අටවැනි හෙන්රි රජුගෙන් පසු ඒ එංගලන්තයේ ජයග්‍රහණය කළේය. අද වන විට බටහිර ලෝකයේ ද ඒ නිසා අනෙක් රටවල ද සමස්තයක් ලෙස ගත් කල අධිපතිවාදී චින්තනය බවට පත් වී ඇත්තේ බටහිර නූතනත්ව

© Prof. Nalin De Silva

ක්‍රිස්තියානි චින්තනය ය. බටහිර නූතනත්ව ක්‍රිස්තියානි යටත් විජිතවාදය (ආර්ථික දේශපාලනික හා සංස්කෘතික) පදනම් වී ඇත්තේ ඒ චින්තනයෙහි ය. එහෙත් කතෝලික චින්තනය මුළුමනින්ම පැරදී පලාගොස් නැත. ඉඳහිට ඇතැම් අවස්ථාවල තරමක් ජයග්‍රාහී ලෙස ඒ ක්‍රියාකරයි.

ඩා වින්චි කෝඩ් පොත හා චිත්‍රපටය ක්‍රිස්තියානි චින්තනය විසින් කතෝලික චින්තනයට විරුද්ධව, ක්‍රිස්තුස් වහන්සේ නොමැති ක්‍රිස්තියානි ආගමක් කරා යන ගමනේ පියවරක් ලෙස නිර්මාණය කරන ලද කෘතීන් වේ. ක්‍රිස්තියානි චින්තනය ආධිපත්‍ය දරන බටහිර රටවල ඒ චිත්‍රපටය තහනම් කිරීමට ඇති ඉඩකඩ අඩුය. එහෙත් ලංකාවේ ඓතිහාසික කරුණු හේතු කොට ගෙන කතෝලික චින්තනයට හා පල්ලියට තවමත් සුවිශේෂ වූ බලයක් ඇත. ඩාවින්චි කෝඩ් ලංකාවේ තහනම් කෙරුණේ එබැවිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva